# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිඳු ජයවර්ධන
නො. 176/3,
ඔරුතොට
ගම්පහ

<u>අභියාචක</u>

අභියාචනා අංකය :
**RTIC/Appeal/552/2023**

එදිරිව

ජනාධිපති ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර
කොළඹ 01

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** :
1. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. ඒ.එම් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ඩී. පෙරේරා මයා පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් නීති සහකාර එල්.ජී හෙක්ටර් මයා පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය** : 2023.08.08

**තීරණය කළ දිනය** : 2023.08.08

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචකගේ 2023.04.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

1. *දේශපාලන පලිගැනීම් ගැන සොයා බැලීම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනධිපතිවරයා විසින් පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ සභාපති උපාලි අබේරත්න මහතාගේ පත්වීම් ලිපියේ සහතික පිටපතක් ලබා දෙන්න .*

2. *දේශපාලන පලිගැනීම් ගැන සොයා බැලීම සඳහා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ සභාපති උපාලි අබේරත්න මහතා වෙත කරන ලද සියලු ගෙවීම් පිළිබඳ විස්තර (වැටුප් සහ සියලුම දීමනා) අදාල*

*කාලසීමාවට අදාලව මාසිකව ලබා දෙන්න. (මාසය/වැටුප රුපියල්/ප්‍රවාහන දීමනා රුපියල්/දුරකතන දීමනා රුපියල්/ඉන්ධන දීමනා රුපියල්/ආහාර පාන සඳහා රුපියල් ඇතුලු සියලුම වියදම්)*

3. *එම ගෙවීම්වලට අදාල රිසිට්පත්වල / වවුචරවල සහතික පිටපත් ලබා දෙන්න.*

4. *එම කොමිෂන් සභාවේ සේවය කළ පිරිස කොපමනද?*

5. *එම කොමිෂන් සභාව සඳහා වැය වූ සම්පූර්ණ මුදල රුපියල් කොපමනද?*

6. *එම කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගැන සොයා බැලීමට පත් කළ අනිත් ජනාධිපති කොමිෂන් සභාව සඳහා වැය වූ සම්පූර්ණ මුදල රුපියල් කොපමනද?*

7. *එම කොමිෂන් සභාවේදී ප්‍රධාන වාර්තාව සහ සියලුම වෙලුම්වල සහතික පිටපත් ලබා දෙන්න. ( සාක්කි සටහන් සහ කාර්‍ය සටහන් ඇතුලුව)*

තොරතුරු නිලධාරි විසින් තොරතුරු පනත ප්‍රකාරව ඊට ප්‍රතිචාර දක්වා නැත. ඒ අනුව අභියාචක විසින් 2023,05.16 දින නම් කල නිලධාරී වෙත අභියාචනයක් යොමු කර ඇත. නම් කල නිලධාරීද පනත ප්‍රකාරව ඊට ප්‍රතිචාර දක්වා නැත. ඉන් අතෘප්තියට පත් අභියාචක 2023.06.06 දින මෙම කොමිෂන් සභාව වෙත සිය අභියාචනය යොමු කර ඇත.

කාර්යාලීය කාර්ය සටහන් අංක 02 අනුව විද්‍යුත් තැපැල් මගින් 2023.07.20 දිනැතිව නොතීසි නිකුත් කරමින් අභියාචනා විමසීම සඳහා සහභාගි වීමට දෙපාර්ශවයට දැනුම් දී ඇත.

**සළකා බැලීම**

මෙම තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු අද දින සිට සතියක් ඇතුළත මුදා හැරීමට පොදු අධිකාරිය එකඟ වේ. ඒ අනුව එම තොරතුරු අද දින සිට සතියක් ඇතුලත අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරියේ ප්‍රධානී, ජනාධිපති ලේකම් ඊ.එම්.එස්.බී ඒකනායක මහතා සහ එහි තොරතුරු නිලධාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් එස්.කේ හේනාධීර මහතා ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේම, "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)" රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.